# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2309/13 – 2022 දෙසැම්බර් මස 06 වැනි අඟහරුවාදා – 2022.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2016/158.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2297/58 දරන හා 2022.09.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පිහිටි ජාතික සේවක සංගමය සහ හම්බන්තොට, මහලේවාය හි පිහිටි ලංකා සෝල්ට් ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 56/2018 දරන හා 2022.01.10 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ලංකා සෝල්ට් ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 56/2018 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2023.09.15 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38264 – 12 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ලංකා සෝල්ට් ලිමිටඩ්
මහලේවාය,
හම්බන්තොට.

දිනය : 2022 ඔක්තෝබර් මස 27 වැනි දින.

කාර්මික සබඳතා අංශය,
11 වැනි මහල,
මෙහෙවර පියස,
නාරාහේන්පිට,
කොළඹ 05.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි,

2022 සැප්තැම්බර් මස 15 දිනැති අංක 2297/58 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, ජාතික සේවක සංගමය සහ ලංකා සෝල්ට් ලිමිටඩ් බැඳී සිටින්නාවූ ද 2022 ජනවාරි මස 10 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන :*

එච්. පී. සුමණසේකර,
සභාපති (වැඩ බලන),
ලංකා සෝල්ට් ලිමිටඩ්.
*වගඋත්තරකාර පාර්ශ්වය.*

*පිටපත* : ජාතික සේවක සංගමය,
නො. 416, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

EOG 12 – 0076

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.